

# වසන්ත ඔබේසේකර

බම්බලපිටිය ලොරිස් පාරේ පදිංචිව සිටි දේශීය වෛද්‍ය උපදේශකවරයකු වූ දොන් ඩේවිඩ් ඔබේසේකර සහ අමරා කන්නන්ගර යුවලගේ බාල දරුවා ලෙස වසන්ත ඔබේසේකර මෙළොව එළිය දුටුවේ 1973 වසරේ දෙසැම්බර් මස 29 දිනය. සිය පියාගේ ගම වූ මීගම විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ හෙතෙම පසුව මහරගම විද්‍යාකර විද්‍යාලයට ඇතුළුව උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබුවේය. 1958 වසරේ සරසවි වරම් ලද වසන්ත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨයට ඇතුළ් විය.

ඉතිහාසය පිළිබඳ විශේෂ උපාධිධාරියෙකු ලෙස 1962 වර්ෂයේදී විශ්ව විද්‍යාලයෙන් පිටවූ ඔහුගේ මුල්ම රැකියාව ගුරු වෘත්තිය විය. විශ්ව විද්‍යාලයෙන් පිටවූ වහාම ඔහුට ගුරු පත්වීමක් ලැබුණේ පස්සර විද්‍යාලයටය. වසර දෙකක සේවා කාලයකින් පසු ගුරු වෘත්තියට සමුදී කොළඹ පැමිණි වසන්ත 1964 වසරේදී ලේක්හවුස් ආයතනයේ මාධ්‍යවේදියකු ලෙස සේවයට එක්වූයේ ඒ වන විටත් මතුවෙමින් පැවැති තමන් තුළ තිබූ කලා කුසලතා දියුණු කරගැනීමට අවස්ථාවක් ලබාගැනීමේද අරමුණ ඇතිවය.

ලේක් හවුස් ආයතනයේ රැකියාව කරන අතර චිත්‍රපට තිර රචනය සහ අධ්‍යක්ෂණයේද නිරත වූ වසන්ත 1970 වසරේ සිනමාව විෂයක් ලෙෂ හැදෑරීමට ශිෂ්‍යත්වයක් ලැබ පැරීසිය බලා ගියේය. එම අධ්‍යන කටයුතු අවසන් කර පෙරළා සිය රට පැමිණි හේ එදා මෙදා තුර සිය ජීවිත කාලය කැප කරනු ලැබුවේ ශ්‍රී ලාංකේය සිනමාව වෙනුවෙනි. සිංහල සිනමා වංශ කතාවේ සුවිශේෂී අනන්‍යතාවක් සනිටුහන් කරනු ලැබූ වසන්ත ඔබේසේකර සිනමාවේදියා විසින් මේ දක්වා නිර්මාණය කරනු ලැබ ඇති චිත්‍රපට සංඛ්‍යාව 13කි.

වසන්ත ඔබේසේකරගේ සිනමා ජීවිතය ඇරැඹෙන්නේ හැටේ දශකය ආරම්භයේ ඔහු විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුව සිටියදීමය. සමකාලීනයෙකු වූ සිරි ගුණසිංහගේ 'සත් සමුදුර' චිත්‍රපටයේ සම තිර රචකයාද, සම අධ්‍යක්ෂවරයාද ලෙසින් හා හා පුරා කියා සිනමාවට පිවිසෙන වසන්ත ඔබේසේකර තිර රචනය ලියා අධ්‍යක්ෂණය කළ ප්‍රථම චිත්‍රපටිය 'වෙස්ගත්තෝ'ය. (1970) ඔහු තිර රචනය ලියා අධ්‍යක්ෂණය කළ දෙවන චිත්‍රපටිය 'වල්මත්වූවෝ' 1976 වසරේ ජීයනැබළු ජාත්‍යන්තර සිනමා උළෙලේ ශ්‍රී ලංකා නියෝජනය විය.

අනතුරුව චිත්‍රපට නිශ්පාදනයටද පිවිසි වසන්ත ඔබේසේකර 1977 වසරේදී 'දියමන්ති' චිත්‍රපටියද, 1979 වසරේ 'පළගැටියෝ' චිත්‍රපටියද නිෂ්පාදනය කළේ ස්වීය තිර රචනය සහ අධ්‍යක්ෂණය යටතේ ය. සිය සිනමා ජීවිතයේ සුවිශේෂ මං සළකුණක් සනිටුහන් කරනු ලැබූ 'පළගැටියෝ' චිත්‍රපටිය 1979 වසරේ නවදිල්ලි ජාත්‍යන්තර සිනමා උළෙලේ අවසන් වටයටද තෝරා ගැණින. 1980 ජාතික චිත්‍රපට උළෙලේ හොඳම තිර රචනය, හොඳම චිත්‍රපටිය හා හොඳම අධ්‍යක්ෂණය ලෙස ජනාධිපති සම්මානයෙන් පිදුම් ලද පළගැටියෝ චිත්‍රපටිය එම වසරේ හොඳම චිත්‍රපටිය ලෙස විචාරක සම්මානයටද පාත්‍රවිය.

ඔහු විසින් තිර රචනය ලියා අධ්‍යක්ෂණය කළ 'දඩයම' චිත්‍රපටිය 1984 ජනාධිපති සිනමා සම්මාන උළෙලේ හොඳම තිර රචනය, හොඳම අධ්‍යක්ෂණය සහ හොඳම චිත්‍රපටිය ලෙස සම්මානයට පාත්‍ර වූ අතර ඒ වසරේ නවදිල්ලි ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේ අවසන් වටයටද තෝරා ගැණින. මැනිලා ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේද ප්‍රදර්ශණය කෙරුණු 'දඩයම' හොඳම චිත්‍රපටිය ලෙස විචාරක සම්මානය ද හිමිකර ගත්තේය.

1989 වසරේ ධක්‍ෂක සම්මාන උළෙලේ හොඳම තිර රචනය, හොඳම චිත්‍රපටිය සහ හොඳම අධ්‍යක්ෂණයට හිමි සම්මානයෙන් පිදුම් ලැබූ 'කැඩපතක ඡායා' වසන්තගේ අතින් නිමැවුණු තවත් සුවිශේෂී චිත්‍රපටියකි. එම චිත්‍රපටිය මොස්කව් ජාත්‍යන්තර චිත්‍රපටි උළෙල සහ මැනිලා සිනමා උළෙලටද ඉදිරිපත් කෙරිණ. හොඳම තිර රචනය සහ අධ්‍යක්ෂණයට හිමි ජනාධිපති සම්මාන හිමිකරගත් 'මාරුතය' (1995), 'දොරකඩ මාරාව' (1998) 'තීර්ථ යාත්‍රා' (1999), 'සළෙළු වරම' (2002), මෙන්ම 'සෙව්වන්දි' සහ 'ආගන්තුකයා' ඔහු අතින් තැණුනු සෙසු චිත්‍රපටිය.

කෙටි චිත්‍රපටි 07ක්ද ටෙලි නාට්‍ය තුනක්ද වසන්ත ඔබේසේකර විසින් නිර්මාණය කරනු ලැබ ඇත. ..

**ඔබගේ සිනමා ජීවිතයේ ආරම්භයෙන් අපේ කතා බහ ආරම්භ කරමු**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්න කාලෙ තමයි මුලින්ම මම සිරි ගුණසිංහගේ 'සත් සමුදුර' චිත්‍රපටියට සම්බන්ධ වුණේ. ඒකේ තිර රචනය ලිව්වේ මමයි සිරි ගුණසිංහයි එකතුවෙලා. ඔහු චිත්‍රපටිය අධ්‍යක්ෂණය කළා. මම සහාය අධ්‍යක්ෂවරයා විදිහට වැඩකළා. මේක ආදායම් අතින් සාර්ථක වුණේ නෑ.

ඊට පස්සේ නිෂ්පාදක ලීනස් දිසානායක කිව්වා හාස්‍ය උත්පාදක චිත්‍රපටියක් කරන්න කියලා. ඒකට මම තිර රචනය කළේ ඉංග්‍රීසි පිටපතක් මුල් කරගෙන. ඒක තමයි 'වෙස්ගත්තෝ' චිත්‍රපටිය. මේක ලිව්වට පස්සේ ලීනස් මට කිව්වා ඔබම මේක අධ්‍යක්ෂණය කරන්න කියලා. මම කිව්වා මට තවම ඒකට දැනුම මදි කියලා. ඔහු තදින්ම කිව්වා නෑ වසන්ත මේක ඔයාට කරන්න පුළුවන් කියලා මට විශ්වාසයි කියලා. පස්සේ මම වැඩේ බාරගත්තා. ඒ කාලේ ඉහලම නමක් තිබුණ විලී බ්ලේක් තමයි කැමරාවට ගත්තේ. ඔහු මට කැමරාව ගැන ගුරුවරයෙක් වුණා. හැම දෙයක්ම කියලා දුන්නා.

හැත්තෑවේ වෙස්ගත්තෝ කරලා ඉවර වෙනකොටම මට ප්‍රංශයේ ශිෂ්‍යත්වයක් ලැබුණා චිත්‍රපට තිර

*<u>ඇන් ඇම්, පීටර් කෙනමන් නිතර මීගම අපේ ගෙදරටත් ඒ කාලේ එනවා යනවා. මේ අය ඉතාම සුන්දර මිනිස්සු.</u>*

රචනය සහ සංස්කරණය ගැන. මම ප්‍රංශයේ ඉන්න කොට තමයි වෙස්ගත්තෝ ප්‍රදර්ශණයට නිකුත් කෙරුණේ. චිත්‍රපටිය පුදුම විදිහට සාර්ථකයි ඔබේ ගාන කීයද කියලා ලීනස් මට ප්‍රංශයට ලිවුමක් එවලා තිබුණා.

ප්‍රංශයේ ඉන්න අතරේ තමයි මම 'වල්මත්වූවෝ' ස්ක්‍රිප්ට් එක ලිව්වේ. ප්‍රංශයට යනකොට මම දිනමිණ කර්තෘ මණ්ඩලයේ රැකියාව කරමින් හිටියේ. ඒ කාලේ දිනමිණ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා මට පැවරුමක් දීලා තිබුණා ජේවීපී එකෙන් පන්ති පහක් පවත්වන කතාවක් යනවා ඒ ගැන හොයලා බලන්න කියලා. ඒ ගැන හොයපු තොරතුරුයි විශ්ව විද්‍යාලේ අත්දැකීම් තමයි වල්මත්වූවෝ ලියන්න බලපෑවේ. මට ප්‍රංශයට යන්න ලේක්හවුස් එකෙන් නිවාඩු දුන්නේ නැති නිසා මම රස්සාවෙන් අස්වෙලයි එහේ ගියේ. ආපහු ආවට පස්සේ මම ආයේ රස්සාවක් කරන්න හිතුවේ නෑ. ඒ වෙනකොට වෙස්ගත්තෝ සාර්ථකවෙලා තිබුණා. මම ලියාගන ආව පිටපතෙන් වල්මත්වූවෝ කරන්න අතගැහුවා. එතනින් පස්සේ දිගටම චිත්‍රපටි කළා මිස වෙනත් යමකට යොමු වුණේ නෑ.

**ඔබ චිත්‍රපටි කීපයක් නිෂ්පාදන කළා නේද ?**

මුලින්ම මම නිෂ්පාදන කළේ 'දියමන්ති' චිත්‍රපටිය. චිත්‍රපට නිෂ්පාදනයට සංස්ථාවෙන් ආධාර දෙන ක්‍රමයක් ඇති කරාට පස්සේ 50% ණයක් අරගෙන කුඹුරු අක්කර පහක් විකුණාලා ඉතුරු සල්ලි හොයාගෙන තමයි මේක කළේ. ආර්ථික පැත්ත ගැන හිතලා මේකට සින්දු දාලා ත්‍රාසජනක ජවනිකා දාලා කළත් චිත්‍රපටිය ඒතරම් සාර්ථක වුණේ නෑ. පස්සේ සංස්ථාව 100% ණය යෝජනා ක්‍රමයක් ගෙනාවට පස්සේ ඒකෙන් ණය අරගෙන 'පළගැටියෝ' කළා. ඒක සාර්ථක වුණා. ඒකෙන් ලක්ෂ තුන හතරක ලාභයක් මට ලැබුණා.

**ඔබගේ සිනමා නිර්මාණ බොහොමයක් සත්‍ය සිදුවීම් පදනම් කරගෙන කළ සංවේදී නිර්මාණ. ඇයි මේ වගේ සිනමා භාවිතයකට ඔබ යොමුවුණේ ?**

මම කොළඹ ඉපදුණාට පුංචි කාලේ ගත කරන්න වුණේ මීගම ගමේ. දෙවැනි ලෝක යුද්දේ නිසා තාත්තා අපිව කොළඹින් ගමට අරගෙන ගියා. ගමේ ඉන්න කාලෙම මට සමාජයේ අසාදාරණයක් තියනවා කියන එක පේන්න පටන්ගත්තා. ඒකට දක්වපු ප්‍රතිරෝධය තමයි අඩු වයසෙන්ම මම වාමාංශික දේශපාලනයට යොමුවෙන්නෙත් පස්සේ මගේ සිනමා නිර්මාණ තුළින් ප්‍රකාශයට පත්වෙන්නෙත්.

**කොහොමද සත්‍ය සිදුවීමකින් තිර රචනයක් ලියන්නේ ?**

හදවතට තදින් දැනෙන සිදුවීමක් අහන්න දකින්න ලැබුණාම, ඒකෙන් චිත්‍රපටියක් කරන්න තීරණය කළාම මුලින්ම මම කරන්නේ ඒ සිදුවීම ගැන ගැඹුරින් අධ්‍යනය කරන එක. සිදුවීමට බලපෑව ආර්ථික සමාජීය හා දේශපාලනික හේතු මොනවද කියලා හොයන්න මම සැළකිය යුතු කාලයක් වැය කරනවා. ඒ පළාත්වලට ගිහිල්ලා තොරතුරු හොයලා බලනවා. ඊට පස්සේ තිර රචනයට අත තියනවා. මම වැදගත් වෙන්නේ ප්‍රේක්ෂකයාගේ කුතුහලය රඳවා තබාගන්නේ කොහොමද කියන එක නෙවෙයි. ඒ නිසා වුණේ මොකක්ද කියලා මම චිත්‍රපටිය ආරම්භයේදීම කියනවා. ඊට පස්සේ ඒකට බලපෑව හේතු ගැන කතාකරනවා. ඒ නිසා මගේ නිර්මාණවල

සංවාදය සහ සේයා රූ
ශ්‍රීලාල් සෙනෙවිරත්න

ආකෘතියේ වෙනසක් තියනවා.

'කැඩපතක ඡායා' චිත්‍රපටිය තල ගණනාවක එක සැරේ යනවා. එක තලයක කිසියම් අවස්ථාවකට අදාළ රූප පෙළ යනකොට තවත් තලයක වෙනත් අවස්ථාවකට අදාළ හඬ පටය යනවා. එහෙම නොකර " එද ' කළා නම් කැඩපතක ඡායා පැය නවයක විතර චිත්‍රපටියක් වෙනවා. අන්තිමටම මම කරපු 'ආගන්තුකයා' චිත්‍රපටියත් මට ඉතාම තදින් දැණුන සිදුවීමක් මුල්කරගෙන කරපු එකක්.

**තල කීපයක එකවර යන චිත්‍රපටියක් තේරුම් ගැනීම ප්‍රේක්ෂකයාට දුෂ්කර විය හැකියි නේද?**

පළගැටියෝ චිත්‍රපටිය කරාට පස්සේ කේ එල් ඩී සිල්වා කියලා මගේ යාලුවෙක් මට කිව්වා ඇයි අපි රූපයෙන් පෙන්වන දේම කතාවෙත් කියන්නේ. මේ දෙක වෙනම එකතු කරලා තවත් අලුත් තලයකට යන්න පුළුවන් නේද කියලා. එයා සිනමාව ගැන හොඳට හදාරපු කෙනෙක්. ඒ වුණත් එයාගේ කතාව මට තේරුණේම නෑ. මාස හයක් තිස්සේ අපි මේ ගැන කතාකළා. එකක් පෙනෙද්දි වෙන එකක් ඇහෙන්න ගියොත් බලන මිනිස්සුන්ට පිස්සු හැදෙයිනේ කියලා මම ඔහුට කිව්වා. ලෙස්ටර් එක්කත් අපි මේ ගැන කතා කළා. ඒ ගැනම හිත හිත ඉන්න අතරේ දවසක් පාන්දර එකට විතර එකපාරටම මට මේ කියන කාරණය තේරුම් ගියා. විශාල කාල පරාශයක් තුළ අඩු වෙලාවකදී එහාට මෙහාට යන්න මේ ක්‍රමයෙන් පුළුවන් කියන එක. මේ විදිහට හැදුන ලෝකයේ පළවෙනි චිත්‍රපටිය තමයි 'කැඩපතක ඡායා'. ඒක සාර්ථක නිර්මාණයක් වුණා.

**චිත්‍රපටිවල එන ඇතැම් ත්‍රාස ජනක දර්ශණ වැනි දේ කැමරා ට්‍රික්ස් කියලයි බොහෝ විට ප්‍රේක්ෂකයන් දකින්නේ. නමුත් ඇතැම් සිනමාකරුවන් සෑම දර්ශණයක්ම ඒ ආකාරයෙන්ම සිදුකර රූපගත කරන්නට උත්සාහ ගන්නවා. මේ වගේ විශේෂිත අවස්ථා රූපගත කිරීමේදී ඔබ මොන වගේ**